# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1947/35 – 2015 දෙසැම්බර් 31 වැනි බ්‍රහස්පතින්දා – 2015.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39(1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දා වූ ද, අංක 1856/13 හා 2014.04.01 වැනි දින දරන රජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද 2014 අංක 79 හා 2014.03.18 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය* වෙත පැවරී තිබේ. එතමුත් මේ කියන ලද ඉඩම් භුක්තිය *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය* වෙනුවෙන් තවම භාර ගෙන නැත. එබැවින් වැඩ බලන ඉඩම් අමාත්‍ය, විජේසුන්දර මුදියන්සේලාගේ තිලකරත්න බණ්ඩාර ඒකනායක වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 1856/13 හා 2014.04.01 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2014 අංක 79 හා 2014.03.18 වැනි දින දරන ආඥාව මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ටී. බී. ඒකනායක,
ඉඩම් අමාත්‍ය. (වැ.බ.)

මගේ අංකය: 4-3/4/2013/ඩී/129.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: කේ/එන්/එල්එල්ආර්සී/පීකේ/01.
2015 දෙසැම්බර් මස 19 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

උතුරු පළාතේ, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, කන්ඩාවෙලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කේඑන්/54 ධර්මපුරම් බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ධර්මපුරම් ගමේ පිහිටි කිලිනොච්චි මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක කේඅයි/කේඑන්ඩී/2013/060 හා 2013.06.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් සඳහන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 4.7517ක් පමණ වූ ඉඩම් කැබැල්ලට මායිම්:

**01. කැබලි අක්ෂර 'ඒ' – ධර්මපුරම්කාඩු – ප්‍රමාණය: හෙක්. 4.7517ක් පමණ**

උතුරට: කැබලි අංක 1043 (ප්‍රා.ස.පාර), කැබලි අංක 1089 (ප්‍රා.ස.පාර), කැබලි අංක 1090 සහ කැබලි අංක 1098න් කොටසක්; නැගෙනහිරට: කැබලි අංක 1089 (ප්‍රා.ස.පාර), කැබලි අංක 1090, කැබලි අංක 1098න් කොටසක්, කැබලි අංක 1039 (ප්‍රා.ස.පාර) සහ කැබලි අංක 1138න් කොටසක්; දකුණට: කැබලි අංක 1039 (ප්‍රා.ස.පාර), කැබලි අංක 1098න් කොටසක්, කැබලි අංක 1138න් කොටසක් සහ 1157 (ප්‍රා.ස.පාර); බටහිරට: කැබලි අංක 1157 (ප්‍රා.ස.පාර) සහ කැබලි අංක 1043 (ප්‍රා.ස.පාර).

01 - 572

1A – G 22788 – 22 (2015/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*